## II (C) වන පරිශිෂ්ඨය

මගේ අංකය :

දිනය :

මහත්මයාණෙනි/ මහත්මියනි
(ලිපිනය )

හිතවත් ................

**අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරක් සඳහා වූ ආදර්ශ පත්වීමේ ලිපිය**

1. ඔබ, (ආයතනයේ නම ), ( තනතුරේ නම ) තනතුර සඳහා ( දිනය ) දින සිට පත්කරන ලද බව සතුටින් දැන්වීමට කැමැත්තෙමි.

2. මෙම තනතුර ස්ථිර තනතුරකි. ඔබගේ සේවය කලින් අවසන් නොකරන්නේ නම්, ඔබ ........................ තනතුරේ වැඩ භාරගත් දිනයේ සිට වර්ෂ තුනක කාලයක් සඳහා සහ තනතුරේ ස්ථිර කොට ඔබට ලිපියක් ලබාදෙන තෙක්, පරිවාස කාලයක් මත තබනු ඇත. ඔබගේ පත්වීම, ඔබ විසින් තනතුරේ වැඩ භාරගත් දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

3. පරිවාස කාල සීමාව තුල හෝ පරිවාස කාලය දීර්ඝ කරන ලද නම්, එම කාල සීමාව තුල දී, කිසිඳු හේතු දැන්වීමකින් තොරව, එක් මසක කල් දීමකින් පසුව හෝ ඒ වෙනුවට මාසයක වැටුප් ගෙවීමෙන් පසු, ඔබගේ සේවය අවසන් කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී සේවය අහිමිවීම සම්බන්ධයෙන් කිසිඳු වන්දියක් ලබා ගැනීමට ඔබට අයිතියක් නොමැත්තේ ය.

4. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එහි සංශෝධනයන්හි එකී පනත යටතේ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනයන්/ විද්‍යායතනයන් විසින් පනවන ලද අනෙකුත් නියමාවලි, රෙගුලාසි අඩංගු ප්‍රතිපාදනයන් සහ රීති ආදිය හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මඟින් පනවනු ලබන සහ ඔබට අදාල වන යම් නීතියක් හෝ නියමයක් පිළිපැදීමට ද ඔබ බැඳී සිටියි.

5. ඔබගේ කායික යෝග්‍යතාවය සහතික කොට, වෛද්‍ය නිලධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය උපයෝගී කරගනිමින් ලබාදුන් වෛද්‍ය සහතිකයක්, ඔබ පත්වීම භාරගෙන එක් මසක කාලයක් ඉක්මයාමට පෙර ඉදිරිපත් කළ යුතු වේ. ඔබ දිවයින තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට අවශ්‍ය කායික යෝග්‍යතාවයක් යුතු බවට වන සහතිකයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, එම කරුණ ඔබගේ පත්වීම අවසන් කිරීමට හේතුවක් වනු ඇත. මෙම වෛද්‍ය පරීක්ෂණයට අදාලව ඔබට දැරීමට සිදුවන කිසිඳු වියදමක්, ඔබ අනුයුක්තව සිටින ආයතනය විසින් ප්‍රතිපූර්ණය නොකෙරේ.

6. ඔබ තනතුරේ වැඩ භාරගැනීමට පෙර, විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹීම අවශ්‍ය වේ.

7. ඔබ විසින් හෝ විශ්වවිද්‍යාලය විසින් එක් මසක කල්දීමකින් අනතුරුව, ඔබගේ සේවය අවසන් කළ හැකි ය. එසේ නැත්හොත්, ඔබ විසින් හෝ විශ්වවිද්‍යාලය විසින් හෝ එක් මසක කල් දීම වෙනුවට, මාසයක වැටුප් ගෙවිය යුතු ය.

8. මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය රු......................... වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවනු ඇත. එයට අමතරව, ජීවන වියදම් දීමනාව සහ රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ද ඔබට ගෙවනු ලැබේ.

9. විශ්වවිද්‍යාල පනතෙහි, XII කොටසෙහි දක්වා ඇති පරිදි, ඔබ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා දායක වියයුතු අතර, ඒ වෙනුවෙන් ඔබගේ මාසික ඉපයීම්වලින් 10% සමාන මුදලක් එකී දායක මුදලට අඩුකර ගන්නවා ඇත. ඒ හා සමඟම, ඔබ සේවය කරන ආයතනය විසින් තම අරමුදල් වලින් ඔබගේ මාසික ඉපයීම්වලින් 15%කට සමාන මුදලක් එම අරමුදලට දායක කරනු ලබන අතර, එම 15% න්, 8%කට සමාන මුදලක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ද, අනෙක් 7% විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා ද බැර කරනු ඇත.

10. 1980 අංක 46 දරන සේවක භාර අරමුදලෙහි නියමයන්ට අනුව සේවක භාර අරමුදලට ඔබ අනුයුක්ත වී ඇති ආයතනය විසින්, ඔබගේ මාසික වැටුපෙන් 3% ක සමාන මුදලක් මාසිකව ගෙවනු ඇත.

11. තම පත්වීමේ දිනයේ සිට අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස දක්වා විශ්වවිද්‍යාල පද්ධතියේ වසර විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි සේවකයින්, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට දායක කර නොගන්නා අතර, එවැනි සේවකයකු විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකයකු ද නොවනු ඇත.

12. ඔබ තනතුරෙන් විශ්‍රාම ගැනීමේ දී, තනතුරෙන් ඉල්ලා අස්වීමේ දී හෝ සේවය නැවැත්වීම යන හේතුමත සේවය අවසන් කරන විට, තමන්ගෙන් ආයතනයට අයවිය යුතු යම් මුදලක් වේ නම්, එම මුදල ඔබගේ අර්ථසාධක අරමුදලෙන් අයකරගැනීමට කැමැත්ත පළ කරමින් ලිපියක් ආයතනයට ලබාදීමට අවශ්‍ය වේ.

13. ඔබගේ පරිවාස කාලය තුල දී, ඔබ විසින් රාජ්‍ය භාෂාවකින් ( සිංහල හෝ දෙමළ ) වැඩ කිරීමේ හැකියාව ලබාගත යුතු අතර, එම කරුණ සඳහා නියම කරනු ලබන ප්‍රවීනතා විභාගයකින්, සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් සමත්වීම මත, ඔබගේ තනතුරේ ස්ථිරවීම රඳා පවතී.

14. පරිවාස කාලය තුල දී, ඔබගේ සේවය අසතුටුදායක වන්නේ නම් සහ/ හෝ එම පරිවාස කාලය තුල දී ඔබ විසින්, නියමිත සිංහල හෝ දෙමළ භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීමට අසමත් වන්නේ නම් හෝ එකී පරිවාස කාලය තුල දී හෝ එය අවසානයේ දී ඔබගේ සේවය අවසන් කිරීමට එම කරුණු හේතුවක් වනු ඇත.

15. පරිවාස කාලය තුල දී, ඔබගේ සේවය සතුටුදායක නම් සහ ඔබ නියමිත ප්‍රවීනතා මට්ටමට ලඟාවී ඇත්නම් ද, ඔබගේ පත්වීමේ ලිපියේ සඳහන් අනෙකුත් කොන්දේසි සතුටුදායක ලෙස සපුරා ඇත්නම් ද, එම පරිවාස කාලය අවසානයේ දී, ඔබ තනතුරේ ස්ථිර කරනු ලබන්නේ ය.

16. පරිවාස කාලය තුල දී, නියම කොට ඇති පූර්ව අවශ්‍යතා සපුරාලීමට අසමත්වීම ඔබගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ නියමිත වැටුප් වර්ධක අත්හිටුවීමට හේතුවිය හැකි ය. එසේ දීර්ඝ කරන ලද පරිවාස කාලයේ පළමු මාස හය (06) ඇතුලත දී, අදාල අවශ්‍යතා සපුරාලීමට ඔබ අසමත් වන්නේ නම්, දැනට අත්හිටුවා ඇති ඔබගේ වැටුප් වර්ධකය, නැවැත්වීමකට/ විලම්භනය කිරීමකට පරිවර්තනය කිරීමට ද සිදුවනු ඇත.

17. ඔබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අදාල කොන්දේසිවලට අනුග්‍රහය දැක්වීමට සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල ව රජය විසින් වරින්වර පනවනු ලබන නීති, රෙගුලාසි සහ රීති වලට අනුකූලව ක්‍රියා කිරීමට අවශ්‍ය වේ.

18. ඔබ සේවය භාරගත් විගසම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 165 වැනි වගන්තිය යටතේ, ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාතීත්වය දක්වන බවට ප්‍රතිඥා හෝ දිවුරුම් දීම කළ යුතු ය. මෙයට අමතරව ඔබ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනයෙහි 5 වන වගන්තියේ 7 වැනි උපලෙඛනයෙහි දක්වා ඇති පරිදි, ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම මඟින් අනුග්‍රහය දැක්විය යුතු ය.

19. මෙම පත්වීම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එහි සංශෝධනයන් ඇතුලත්ව, එකී පනතේ 86 වන වගන්තියට අනුව, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබිය හැකි ය.

20. ඔබ, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එහි සංශෝධන ද ඇතුලත්ව, එකී පනතේ 78 වන වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ උසස් අධ්‍යාපන ආයතන/ විද්‍යායතන අතරේ ස්ථාන මාරු කිරීමට හැකියාව තිබේ.

21. ඔබ සේවය භාරගන්නා අවස්ථාවේ දී, ඔබගේ උප්පැන්න සහතිකයේ සහ අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කොට ආපසු භාරදීම සඳහා, අනධ්‍යයන ආයතන අංශය වෙත භාරදිය යුතු ය. ඔබ විසින් එසේ ඉදිරිපත් කරන ලද උප්පැන්න සහතිකයේ සහ අධ්‍යාපන සහතිකවල යම් විෂමතාවයක් ඇති බව සොයාගනු ලැබුවහොත්, කිසිඳු දැනුම්දීමකින් තොරව ඔබගේ සේවය අවසන් කරනු ඇත.

22. ඔබ, මෙම පත්වීම් ලිපියෙහි සඳහන් නියමයන් සහ කොන්දේසිවලට අනුව, තනතුරෙහි වැඩ භාරගැනීමට කැමැති නම්, ඒ බව මෙම ලිපියේ දෙවන පිටපත අවසානයේ ඇති සේවය භාර ගැනීමට එකඟතාවය පළ කිරීමේ ලිපියෙහි අත්සන් කොට ආපසු භාර දිය යුතු ය.

**(මෙයට අමතර ව, සමහර තනතුරු සඳහා විශේෂයෙන් ඇතුලත් කළ යුතු තනතුරට විශේෂිත කොන්දේසි, අදාල පරිදි එම පත්වීමේ ලිපිවලට ආදේශ කළ යුතු ය)**

ඔබගේ හිතවත්

ලේඛකාධිකාරී

පිටපත්:

1. මූල්‍යාධිකාරී
2. පුස්තකාලයාධිපති
3. අදාල දෙපාර්තමේන්තුවේ/ අංශයේ/ මධ්‍යස්ථානයේ/ ඒකකයේ අංශ ප්‍රධාන
4. ප්‍රධාන වෛද්‍ය නිලධාරී
5. විගණකාධිපති
6. නිවාඩු කටයුතු භාර නිලධරයා
7. පෞද්ගලික ලිපි ගොනුව

……………………………………………………………………………………………………

**පත්වීම භාරගැනීමට කැමැත්ත පළකිරීමේ ලිපිය**

ලේඛකාධිකාරී
......................... විශ්වවිද්‍යාලය

ඉහතින් දක්වා ඇති පත්වීමේ ලිපියේ නියමයන් සහ කොන්දේසිවලට අනුව, පත්වීම භාර ගැනීමට කැමති බව මෙයින් දන්වා සිටිමි.

දිනය: …………………..                                  ……………………………..
අත්සන